**උතුරු මැද පළාත් සභාව - 2017**

**-----------------------------------**

උතුරු මැද පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2018 ජූලි 31 දිනවන විට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරිමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කල ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 31 | 31 |
| (ii) | ආදායම් ගිණුම් | 20 | 20 |
| (iii) | පළාත් සභා නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 33 | 33 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 06 |
| (v) | අනෙකුත්අරමුදල් ගිණුම් | 06 | 06 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 05 |
| | | 101 | 101 |

2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාව ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පළාත් සභා අරමුදලින් මිලදී ගෙන තිබුණු සියළුම ජංගම නොවන වත්කම් හා එදිනට පැවති සියළුම කෙරීගෙන යන වැඩවල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණු රු.21,643,314,217 ක් වූ මුළු ජංගම නොවන වත්කම්වල ආරම්භක ශේෂයන්, වර්ෂය තුල එකතු කිරීම්, වර්ෂය තුල ඉවත් කිරීම්, ප්‍රත්‍යාගණනයන්, සමුච්චිත ක්ෂය හා ශුද්ධ අගය යනාදී තොරතුරු අනාවරණය නොකර පිරිවැය පමණක් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බදු නොවන ආදායම් යටතේ රු.17,341,221 ක පාවිච්චි කරන ලද වාහන හා උපකරණ විකුණුම් ආදායමක් දක්වා තිබුණද එකී වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය සඳහා අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි. එසේ වුවත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්වල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තා අනුව රු.19,226,118 ක ජංගම නොවන වත්කම් අපහරණය කර තිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු ගිණුම් දෙකකට අදාළව එකතුව රු.28,882,957 ක ලැබිය යුතු ආයෝජන පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

2.2.4 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයයන් 02 ක පැවති ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් අතර රු.13,611,198 ක නොසැසඳීම් පැවතුණි.

(ආ ) දෙපාර්තමේන්තු 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව මූලධන බැරකම් රු.7,841,822 ක් වූ නමුත් දෙපාර්තමේන්තුවලට අදාල විසර්ජන ගිණුම්වල එකී බැරකම් රු.39,385,858 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් රු.31,544,036 ක නොසැසඳුණු වෙනසක් විය.

(ඇ) එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කර තිබුණු විසර්ජන ගිණුම්වල යටිතල, පිරියත හා උපකරණවල සහ ඉඩම් හා ගොඩනැගිලිවල ආරම්භක ශේෂ එකතු වටිනාකම් පිළිවෙලින් රු.3,185,604,511 ක් හා රු.13,577,268,204 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂයන් පිළිවෙලින් රු.3,294,602,112 ක් හා රු.3,132,938,265 ක් වූයෙන් පිළිවෙලින් රු.108,997,601 ක සහ රු.10,444,329,939 ක වෙනස්කම් පැවතුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව යටිතල, පිරියත හා උපකරණවල හා ඉඩම් හා ගොඩනැගිලිවල එකතු අවසන් ශේෂය පිළිවෙලින් රු.2,613,215,248 ක් හා රු.19,030,098,969 ක් වූ නමුත් එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කර තිබුණු විසර්ජන ගිණුම් අනුව එම ශේෂයන් පිළිවෙලින් රු.3,701,073,643 ක් හා රු.24,324,341,174 ක් වූයෙන් පිළිවෙලින් රු.1,087,858,395 ක සහ රු.5,294,242,205 ක වෙනස්කම් පැවතුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 04 කට අදාලව රු.1,984,636 ක බැර ශේෂයක් හා රු.44,574 ක හර ශේෂයක් වර්ෂ 08 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණු අතර එකී ශේෂයන්හි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. අදාල ශේෂයන් නිරවුල් කිරීමට, පළාත් භාණ්ඩාගාරය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.87,615 ක බැර ශේෂයන් පමණක් නිරවුල් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 06 ක එකතු බැර ශේෂය රු.2,129,729 ක් සහ වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක එකතු බැර ශේෂය රු.1,150,440 ක් වූ අතර ඉන් පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්වල බැර ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එන්නක් විය.

2.2.6 අග්‍රිම ගිණුම්

--------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 07 ක් විසින් නිරවුල් නොකල අග්‍රිම හර ශේෂයන්හි එකතුව රු.39,083,855 ක් වූ අතර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිරවුල් නොකල අග්‍රිම බැර ශේෂය රු.56,293 ක් විය.

(ආ) පළාත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 05 කට අදාළව පියවා නොතිබුණු රු.35,380,111 ක අග්‍රිම හර ශේෂ වර්ෂ 03 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. එයින් රු.26,405,861 ක් ප්‍රධාන අමාත්‍යාංශයට අදාල වූ අතර එය වර්ෂ 08 කට වඩා පැරණි විය.

2.2.7 පොදු තැන්පත් ගිණුම්

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල 2017 දෙසැම්බර් 31 දිනට වූ ශේෂවල එකතුව පිළිවෙලින් රු.603,771 ක් සහ රු.4,542,731 ක් විය. ඉන් වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව පිළිවෙලින් රු.128,259 ක් සහ රු.790,689 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම වෙනත් දෙපාර්තමේන්තු සහ බාහිර පුද්ගලයන් විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු පිළිවෙලින් රු.383,702 ක සහ රු.667,762 ක මුදලක් අදාල කාර්යයන් ඉටුකර ගැනීමට යෙදවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ක වූ නිරවුල් නොවූ තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.61,134,053 ක් වූ අතර, වර්ෂ 02 කට අධික කාලයක් ඉක්ම වූ ශේෂවල එකතුව රු.814,207 ක් විය.

2.2.8 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------

පිළිතුරු නොලත් විගණන විමසුම්

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාවේ ආයතන 05 ක් වෙත සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කර තිබුණු ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,032,458,569 ක් වූ විගණන විමසුම් 22 කට සහ ඉකුත් වර්ෂයට අදාලව නිකුත් කර තිබුණු ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු.980,782 ක් වූ විගණන විමසුම් 02 කට 2018 අගෝස්තු වනවිටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව විසින් පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ විගණන විමසුම් 13 කට 2018 අගෝස්තු වනවිටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර 2017 නොවැම්බර් 10 දිනෙන් පසු විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

2.2.9 අනුකූල නොවීම්

-------------------

2.2.9.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 42 දරන පළාත් සභා පනත | 4,227,019 | පනතේ විධිවිධානවලට පටහැනිව සභා නායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන තනතුරු ඇති කර පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද ඉක්මවූ වරප්‍රසාද එකී තනතුරුධාරීන්ට ලබාදී 2017 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.4,227,019 ක් ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂ 05 ට අදාලවද එකී වරප්‍රසාද වෙනුවෙන් රු.30,007,143 ක් ගෙවා තිබුණි. |
| (ආ) උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | | |
| (i) ප.මූ.රී. 54.4 | - | දෙපාර්තමේන්තු 03 කට අයත් වාහන 22 කට සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබුණු අනතුරු 33 ක් වෙනුවෙන් එකී අනතුරු සිදුවී මාස 04 සිට අවුරුදු 03 මාස 9 ක කාලයක් ගතවී තිබුණද මූලික විමර්ශන පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර අදාල හානි සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. තවද මෙම හානිවල වටිනාකම් රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමටද 2018 ජුනි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) ප.මූ.රී. 169.1 | 727,825 | පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සහතික කර නොතිබුණු වවුචර් 29 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| | (iii) ප.මූ.රී. 259 | 26,550,411 | 2010 වර්ෂයේදී වැව් පුනරුත්ථාපනය වෙනුවෙන් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2017 වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. |
| | (iv) ප.මූ.රී. 283.4 | 196,678 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ බැංකු සැසඳුම්වල නිකුත් කර මාස 06 ක කාලයක් ඉකුත් වී තිබුණු චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) | 5,119,243 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉකුත් තැන්පතු 55 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 24/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | පළාත් සභාවේ අමාත්‍යවරු හා ධූරධාරීන් ඇතුළු පළාත් සභා මන්ත්‍රීවරුන් 33 දෙනෙකුගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය සඳහා 2014 නොවැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව අන්තර් දීමනා වශයෙන් රු.27,244,074 ක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් ගෙවා තිබුණි. |

(ඉ) 2014 ජනවාරි 28 දිනැති අංක 2014/01 දරන පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය - අනුරාධපුර ආයුර්වේද රෝහලට අනුයුක්ත නිලධාරීන් 23 දෙනෙකුට අදාලව වර්ෂ 05 සිට වර්ෂ 32 දක්වා කාල පරාසයක් තුළ ස්ථානමාරු ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කර නොතිබුණි.

2.2.9.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

------------------------------------------

2015 ජූලි 06 දිනැති අංක SEC/2015/05 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව මාසික පාරිශ්‍රමිකය රු.62,500 ක් ඉක්මවා තිබුණු, පළාත් වාරි මාර්ග,ඉඩම්,ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් උපයන විට ගෙවීම් බදු අඩු කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

03. ආදායම් කළමනාකරණය

-------------------------------

පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ආදායම් ශීර්ෂ 05 කට අදාල ආදායම් සංකේත 21 ක් යටතේ රු.3,661,269,184 ක් රැස්කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ රු.3,553,017,374 ක් වූ ආදායම සමඟ සැසඳීමේදී සියයට 03 ක එනම් රු.108,251,810 ක වර්ධනයක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 21 ක් යටතේ වූ ආදායම් පළාත් සභාවේ මුළු ආදායමින් සියයට 16 ක් වූ නමුත් ඉකුත් වර්ෂයේදි එය සියයට 18 ක් විය.

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාව ආරම්භ කර අවුරුදු 26 ක් ඉක්ම ගොස් තිබුණද පළාත තුල පිහිටි උකස් මධ්‍යස්ථාන නියමානුකූල කර ඒවා ලියාපදිංචි කිරීමේදී හා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී ගාස්තු අයකිරීමට අදාල ප්‍රඥප්තියක් අනුමත කරගෙන නොතිබුණි.

(ආ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් බදු අයවිය යුතු ඉඩම් ප්‍රමාණය හා අයවිය යුතු බදු වටිනාකම පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ඉඩම් බදු ආදායම නිශ්චිතව ඇස්තමේන්තු කිරීමට නොහැකි වී ඇති අතර වර්ෂ අවසානයට හිඟ බදු ආදායම ගණනය කිරීමටද නොහැකි වී තිබුණි.

(ඇ) මත්පැන් බලපත්‍රලාභීන්ගේ ලේඛනයක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

04. මූල්‍ය සමාලෝචනය

-------------------------

4.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.305,268,801 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.980,543,868 ක් විය.

4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වෙනත් වියදම්, වැටුප් හා වේතන සහ සහනාධාර ඇතුළුව මුළු වියදම රු.541,644,201 කින් වැඩි වී තිබුණද ඌණතාවය රු.675,275,069 කින් අඩු වීම කෙරෙහි රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබුණු මුදල් රු.1,384,789,353 කින් හා බදු ආදායම රු.157,968,470 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

05 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

----------------------------------------------------------------------------------------------------

5.1 ප්‍රඥප්ති ගිණුම් / අරමුදල් ගිණුම්.

-------------------------------------

5.1.1 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

----------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවයෙන් පහකර සිටි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගණකාධිකාරීවරයා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් සාවද්‍ය කරුණු දක්වමින් නැවත සේවයේ පිහිටුවා තිබුණු අතර එකී ගණකාධිකාරීවරයා සම්බන්ධයෙන් පැවැත්වෙමින් තිබුණු වෙනත් විධිමත් විනය පරීක්ෂණයක්ද අධිකාරියේ වැඩ බලන ලද සාමාන්‍යාධිකාරිවරයෙකු විසින් තම බලය ඉක්මවා යමින් ඉවත්කර ගෙන තිබුණි. තවද අධිකාරිය විසින් ඉදිරිපත් කල සාවද්‍ය තොරතුරු පදනම් කරගෙන ප්‍රධාන ලේකම් විසින් මොහුට සහනදායී පදනම මත වාහන බලපත්‍රයක් ද සමාලෝචිත වර්ෂය තුල ලබා දී තිබුණි.

(ආ) අනුමත ප්‍රතිපාදන නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදී රු.14,600,772 ක් වූ බැරකම්වලට අධිකාරිය එළඹ තිබුණි.

(ඇ) අධිකාරිය විසින් 2015 ඔක්තෝබර් සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රු.5,357,470 ක එකතු කල අගය මත බදු අයකරගෙන තිබුණු නමුත් එම කාලය තුළ අක්‍රීයව තිබුණු එකතු කල අගය මත බදු ගොනුව සක්‍රීය කර එකී බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) අධිකාරිය විසින් භාවිතා කරනු ලබන වෙනත් ආයතන සතු රු.95,960,400 ක වත්කම් අධිකාරිය වෙත පවරා ගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු ගිණුම් 08 ක වූ රු.23,255,035 ක් අයකර ගැනීමට සහ ගෙවිය යුතු ගිණුම් 02 ක වූ රු.1,501,250 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

5.1.2 උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

---------------------------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාල රු.17,518,141 ක් වූ එකතු කළ අගය මත බදු සහ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත ප්‍රකාරව 1999 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා කාලය තුලදී එකතුකර තිබුණු රු.8,966,846 ක් වූ භාණ්ඩ හා සේවා බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර රඳවා ගෙන තිබුණි. ඊට අමතරව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වරිපනම් බදු රු.4,483,123 ක් විය.

(ආ) 1990 අංක 11 දරන උතුරු මැද පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ ඇතුලත් අරමුණුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් හා ඒජන්සියේ යහපතට උපස්ථම්භක වන වෙන යම් කාර්යයන් සඳහා මුදල් ලබාගැනීමට අරමුදලක් ඇති කිරීම යන අරමුණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වර්ෂ 03 සිට වර්ෂ 16 ක් දක්වා කාලයක් ස්වභාවික ආපදාවන්ට ගොදුරු වෙමින් පවතින ඒජන්සිය සතු වාහන 19 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට 2018 අප්‍රේල් 24 වනවිටත් කටයුතු කර නොතිබුණි.

5.1.3 මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

-----------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ මාස 03 ක් සඳහා ගෙවිය යුතු රු.3,000,000 ක් වූ පෙර පාසල් ගුරු දීමනා 2017 වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු නොකර ඉදිරියට ගෙන ගොස් තිබුණි.

(ආ) අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කල පුවත්පත් අලෙවියෙන් 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.681,712 ක් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) 2013 නොවැම්බර් 14 දින සිට 2015 මාර්තු 19 දින දක්වා මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ සේවය කල කළමනාකරණ අධ්‍යක්ෂවරයා 2014 ඔක්තෝබර් මාසයේ ගුරු දීමනා මුදල් රු.900,000 ක් ගුරුවරුන්ට නොගෙවා වංචා කර තිබුණු නමුත් මෙම වංචාව පිළිබඳව ප්‍රාරම්භක පරීක්ෂණයක් 2018 අප්‍රේල් 24 දින වන විටද පවත්වා නොතිබුණි. එසේම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී පළාත් මූලා රීති 76.1.1 හා 76.2.1 ප්‍රකාරව කටයුතු නොකර 2015 මාර්තු 19 දින ඔහුගේ පත්වීම බල රහිත කර තිබුණු අතර මෙම නිලධාරියා භාරයේ තිබුණු රු.146,898 ක් වටිනා උපකරණ හා කාර්යාල ලිපිගොනු 03 ක් ආපසු ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

5.1.4 පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

-----------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියේ ඉලක්කගත අරමුණු නොසලකා සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම, ව්‍යවසායකයින් පුහුණු කිරීම හා මූල්‍යාමය ණය පහසුකම්වලට පමණක් සීමාවී තිබුණි.

(ආ) 2010 හා 2012 වර්ෂවල ණය වැඩසටහන යටතේ අධිකාරියේ ලියාපදිංචි ව්‍යවසායකයින් සඳහා රු.3,997,488 ක් වටිනා ප්‍රාග්ධන උපකරණ ප්‍රදානය කර තිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව ණය ආපසු ගෙවීමේ කාලසීමාව වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා කාලයක් ඉක්මවා තිබුණද, එකී ණය මුදලින් රු.1,319,860 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි.

(ඇ) කර්මාන්ත ව්‍යවසායක සංගම් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යවසායක සංගම් 02 ක් වෙත ලබාදී තිබුණු රු.200,000 ක ණය මුදලින් 2018 සැප්තැම්බර් 30 දින වනවිට හිඟ හිට තිබුණු රු.61,466 ක් වූ ණය වාරික සහ පොලී අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) කර්මාන්ත ගම්මාන චක්‍රීය අරමුදල් ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී අධිකාරියට ලැබී තිබුණු රු.මිලියන 5.1 කින් ව්‍යවසායක සංගම් 05 ක් වෙත රු.5,099,980 ක ණය ප්‍රදානය කර තිබුණු නමුත්, ණය මුදල් සුරක්ෂණය ලෙස අත්සන් තබන ලද පොරොන්දු නෝට්ටුවක් පමණක් ලබාගෙන තිබුණි. එක් ව්‍යවසායක සංගමයට ලබාදී තිබුණු රු.1,615,000 ක ණය මුදලින් ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු ණය වාරික 2017 ජුලි මාසයෙන් පසු අයවී නොතිබුණි.

5.1.5 පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

-----------------------------------

ප්‍රධාන අමාත්‍ය අරමුදලට වැය ශීර්ෂවලින් අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා එකී අරමුදලට අදාළ ප්‍රඥප්තිය මඟින් විධිවිධාන සලසා නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයක් යටතේ රු.17,500,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි.

06. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

6.1 කාර්ය සාධනය

------------------

6.1.1 අධ්‍යාපන

-----------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුභවතුන්ට අතිරේකව ගුරු උපදේශකවරුන් 322 ක් හා විෂය අධ්‍යක්ෂවරුන් 72 ක් උතුරු මැද පළාත තුල සේවයේ යොදවා තිබුණි. 2017 වර්ෂයේදී සේවාස්ථ සැසි පැවැත්වීම වෙනුවෙන් අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ රු.26,500,000 ක් සහ පළාත් සභා හා මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේ රු.73,234,107 ක් වැයකර තිබුණි. එසේ වුවත් 2017 වර්ෂයේදී අ.පො.ස.(සා.පෙ.) විභාගය සඳහා පෙනී සිටි සිසුන් 19,455 ක් අතුරින් සිසුන් 628 දෙනෙකු සියළුම විෂයන්ගෙන් අසමත් වී තිබුණු අතර අ.පො.ස.(උ.පෙ.) විභාගය සඳහා පෙනී සිටි සිසුන් 12,130 ක් අතුරින් සිසුන් 1,188 දෙනෙකු සියළුම විෂයයන් අසමත් වී තිබුණි. එසේම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි සිසුන් 24,836 දෙනෙකුගෙන් සිසුන් 7,358 ක් ප්‍රශ්න පත්‍ර දෙකම සඳහා ලබාගෙන තිබුණු මුළු ලකුණු සංඛ්‍යාව 70 ට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 1963/30 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) ගැසට් පත්‍රයේ 4.2 ඡේදය ප්‍රකාරව පාසලකට ඇතුලත් නොවූ, පාසල් හැරයාමේ අවදානමට ලක්ව ඇති සහ අපේක්ෂිත සාධන මට්ටමට පැමිණ නැති ළමුන් සම්බන්ධයෙන් පාසල් කමිටු, අධීක්ෂණ කමිටු, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අවස්ථානුකූලව ඉදිරිපත් කලයුතු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2017 වර්ෂයේදී උතුරුමැද පළාතේ හඳුනාගත් පාසල් නොයන පිරිමි ළමුන් 363 දෙනෙකු සහ ගැහැණු ළමුන් 221 දෙනෙකු වූ අතර 2017 දෙසැම්බර් 31 දින වනවිට ඉන් අධ්‍යාපනයට යොමුකර තිබුණේ පිරිමි ළමුන් 135 දෙනෙකු හා ගැහැණු ළමුන් 67 දෙනෙකු පමණි. එකී ළමුන් සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ පූර්ණ වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර පාසල්ගත කිරීමෙන් මාස 03 ට පසු පාසල් අධීක්ෂණ කමිටු විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතු ප්‍රගති වාර්තා එවා නොතිබුණි.

(iii) අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන නිර්නායකයක් වූ අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වී නොමැති සිසුන් පිළිබඳව කිසිදු කලාප අධ්‍යාපන කාර්යාලයකින් තොරතුරු වාර්තා කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ රු.264,894,898 ක මධ්‍යම රජයේ ප්‍රතිපාදන මත උතුරු මැද පළාතේ පාසල්වල ක්‍රියාත්මක කළ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2017 ඔක්තෝබර් 15 දිනට පෙර අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවත් 2017 දෙසැම්බර් 31 දින වනවිටද නියමිත භෞතික ප්‍රගතිය ළඟාකරගෙන නොතිබුණු අතර විස්තර පහත දැක්වේ.

(i) Type B යටතේ පාසල් 208 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය පාසල් 78 කට අදාලව සියයට 40 ක් දක්වාද, පාසල් 88 කට අදාලව සියයට 40 සිට 60 දක්වාද , පාසල් 20 කට අදාලව සියයට 60 සිට 80 දක්වා ද පමණක් බව නිරීක්ෂණය විය. පාසල් 42 කට අදාලව පමණක් සියයට 80 ත් 100 ත් අතර ප්‍රතිශතයකින් භෞතික ප්‍රගතියක්ද, පැවතුණි.

(ii) Type G යටතේ පාසල් 27 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය පාසල් 25 කට අදාලව සියයට 80 කට අඩු මට්ටමක පැවති අතර පාසල් 02 කට අදාලව පමණක් සියයට 80 කට වැඩි මට්ටමක පැවතුණි.

(iii) Type BG යටතේ පාසල් 46 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය පාසල් 35 කට අදාලව සියයට 80 කට අඩු මට්ටමක පැවති අතර පාසල් 11 කට අදාලව පමණක් සියයට 80 ට වැඩි මට්ටමේ පැවතුණි.

(ඈ) 2016/2017 වර්ෂයේදී උතුරු මැද පළාතේ පාසල්වල සිංහල/දෙමළ මාධ්‍යය ගණිතය, ඉංග්‍රීසි වැනි විෂයයන්හි ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවාගෙන තිබුණු උපාධිධාරීන් 68 දෙනෙකුගේ උපාධියේ අදාල විෂය ආවරණය සියයට 30 ටත් වඩා අඩු මට්ටමක පැවති අතර පළාත තුල සුදුසුකම් සහිත උපාධිධාරීන් ප්‍රමාණවත්ව නොසිටීම මෙයට හේතු වී තිබුණි.

6.1.2 සෞඛ්‍ය

----------

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) 2015 වර්ෂයේ 1,120 ක් වූ බෝවන රෝග ආසාධිතයන් ගණන 2016 හා 2017 වර්ෂවල සියයට 12 කින් හා සියයට 20 කින් අඩුකර ගැනීම ඉලක්කය වුවද, සමස්ථ රෝගීන් ගණන අදාල වර්ෂ 2 හි පිළිවෙලින් සියයට 9.5 කින් හා සියයට 95 කින් වර්ධනය වී තිබුණි.

(ආ) 2017 වර්ෂයේ වාර්ෂික සැලැස්ම අනුව නව ලාදුරු රෝගීන්ගේ ප්‍රමාණය 40 ට වඩා අඩුවෙන්ද, ඩෙංගු රෝගීන් ප්‍රමාණය 182 කට වඩා අඩුවෙන්ද, ලිෂ්මනයිසිස් රෝගීන් ප්‍රමාණය 67 කට වඩා අඩුවෙන්ද පැවතිය යුතු වුවත් සත්‍ය රෝගින් ප්‍රමාණය පිළිවෙලින් 46 ක්, 1086 ක් සහ 182 ක් වී තිබුණි.

6.1.3 වෙනත්

--------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ ලියසවිය ව්‍යාපෘතිය යටතේ මැහුම් පුහුණු පාඨමාලා 03 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා සම්පත් දායක දීමනා ලෙස රු.1,824,000 ක් ගෙවා තිබුණි. එසේ වුවත් එකී පාඨමාලා 03 සඳහා බඳවාගෙන තිබුණු, පිළිවෙලින් 485 ක්, 460 ක්,35 ක් වූ සිසුන් අතුරින් පාඨමාලා අවසන් කර තිබුණේ පිළිවෙලින් සිසුන් 264 ක්,280 ක් සහ 13 ක් පමණක් වූ අතර විභාගයට පෙනී සිටි එකී සිසුන්ගෙන් සියයට 40 ක් විභාගය අසමත් වී තිබුණි.

(ආ) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 හි පිහිටුවා තිබුණු ග්‍රාම සංවර්ධන සමිති 838 කින් සමිති 308 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිට අක්‍රියව පැවතුණි. එසේ වුවත් ඒවා සක්‍රීයව පවත්වා ගෙන යාමට අවශ්‍ය ක්‍රියා මාර්ග දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

(ඇ) පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පොකුරු ගම්මාන 18 ක් පිහිටුවීම සඳහා රු.15,777,003 ක මුදලක් වැයකර තිබුණි. එකී පොකුරු ගම්මාන 18 න් ගම්මාන 02 ක් 2017 දෙසැම්බර් වනවිට අක්‍රිය මට්ටමේ පැවතුණු අතර 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයේදී පුහුණු කර තිබුණු ප්‍රතිලාභීන් 188 දෙනෙකු අතුරින් 84 දෙනෙකු මෙම වැඩසටහනින් ඉවත් වී තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබීම නිසා ප්‍රගතිය පරීක්ෂා කල නොහැකි විය.

(ඈ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ අධ්‍යයන වර්ෂ වලදී වඩු පාසල් සඳහා සිසුන් 700 දෙනෙකු බඳවා ගැනීමට හැකියාව තිබුණු නමුත් පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් බඳවා ගෙන තිබුණේ සිසුන් 217 දෙනෙකු පමණි. එකී කාලය තුල සිසුන් බඳවා ගෙන නොතිබුණු වඩු පාසල් ගණන 07 ක් වූ අතර බඳවා ගත් සිසුන් 217 දෙනාගෙන් සිසුන් 87 දෙනෙකු පාඨමාලාව නිම නොකර අත්හැර දමා ගොස් තිබුණි. එසේම වඩු පාසල්වලින් සාර්ථකව පාඨමාලාව නිමකල සිසුන් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමේ වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා සිසුන් 552 දෙනෙකු බඳවා ගෙන තිබුණු නමුත් ඉන් සිසුන් 259 දෙනෙකු පාඨමාලාව අතහැර දමා ගොස් තිබුණි. 2017 වර්ෂයේදී සිසුන් බඳවා නොගත් පේෂකර්ම මධ්‍යස්ථාන 28 ක් පැවතුණි. එසේම 2017 වර්ෂයේ පේෂකර්ම නිෂ්පාදන අලෙවි ආදායම 2016 වර්ෂයට සාපේක්ෂව රු.1,271,618 කින් පහත වැටී තිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අදාළ පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 09 ක පැවති රු.1,401,872 ක හර ශේෂ 07 ක් හා රු.33,157 ක බැර ශේෂ 02 ක් ගනුදෙනු සිදු නොවී වර්ෂ 02 ත් 06 ත් අතර කාලයක් ගතවී තිබුණු නමුත් මෙම ශේෂයන් නිරවුල් කර ගැනීමට පියවරගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම තහවුරු කළ නොහැකි ලිපි ද්‍රව්‍ය,විවිධ උපකරණ හා ඇඳුම් වර්ග 30 කට අදාල ද්‍රව්‍ය ඒකක 4,584 ක් 2017 දෙසැම්බර් වන විටත් ලේඛනගතකර නොතිබුණි.

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරුන් 12 දෙනෙකු විසින් 2017 වර්ෂයේ අනුමත නිවාඩු ප්‍රමාණය ඉක්මවා වැටුප් රහිත නිවාඩු 465 ක් ලබා ගෙන තිබුණු නමුත් එකී වැටුප් රහිත නිවාඩු සඳහා අඩු කිරීම් කර නොතිබුණි.

(ඈ) ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අක්කර 45 යි රූඩ් 02 යි පර්චස් 15 ක් පමණ වූ ඔසු උයන් සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් කම්කරුවන් අනුමත වී නොමැතිවීම හේතුවෙන් ඒවා නඩත්තු කිරීම සීමා කර තිබුණු අතර, දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යන රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා හා ඔසු උයන් සහිත අක්කර 86 කට වැඩි ඉඩම්, දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රතිකාර සඳහා ඖෂධ යොදා ගැනීමෙන් පසුව ඉවත දමන හිස් වීදුරු බෝතල් ආයුර්වේද රෝහල් භූමිවල එලිමහනේ අසුරා තිබුණු අතර මෙම බෝතල් ඉවත් කිරීමට හෝ නැවත ප්‍රයෝජනයට ගත හැකි පරිදි සකස් කිරීමට විධිමත් ක්‍රමවේදයක් ආයුර්වේද රෝහල් විසින් අනුගමනය කර නොතිබුණි.

(ඊ) ආයුර්වේද ඖෂධ මිල ඉහළ යාම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ඇතැම් ඖෂධ ආනයනය සීමාකිරීම, වියළි ඖෂධ නියමිත කාලය තුළ නොලැබීම හා ප්‍රමාණාත්මකව නොලැබීම යනාදි කරුණු හේතුවෙන් රෝහල්වල අත්‍යවශ්‍ය ඖෂධ වර්ගවල දැඩි හිඟයක් වර්ෂය මුළුල්ලේම පැවතුණු අතර එම නිසා රෝගීන්ට එම ඖෂධ පිටතින් මිලදී ගැනීමට සිදුව තිබුණි. තවද, මෙම ගැටළුව නිසා ආයුර්වේද ප්‍රතිකාර කෙරෙහි උනන්දුවක් දක්වන ජනතාවට ප්‍රතිලාභ නිසි පරිදි ලබාගැනීමට ද නොහැකි වී තිබුණි.

(උ) ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය හදාරා ඇති ආයුර්වේද රෝහල්වල හා මධ්‍යම බෙහෙත් ශාලාවල සේවය කරන වෛද්‍යවරුන්ගේ දැනුම ප්‍රයෝජනයට ගනිමින් රෝගීන්ට සහන සැලසීමට ඇති අවස්ථාව, එකී ආයතනවල Pressure Meter, E.N.T Set යනාදී මූලික උපකරණ සහ රසායනාගාර පහසුකම් නොමැතිවීම හේතුවෙන් අහිමි වී තිබුණි.

(ඌ) පාරම්පරික වෛද්‍යවරුන් පුහුණු කිරීමේ අරමුණින් ගාලදිවුල්වැව ආයුර්වේද රෝහල් භූමියෙහි පිහිටුවා තිබුණු පුහුණු මධ්‍යස්ථානය වර්ෂ 02 කට ආසන්න කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.

(එ) මනම්පිටිය රෝහලේ නව වාට්ටු සංකීර්ණය රු.7,983,782 ක් වැයකර 2017 ජූලි 22 දින නිමකර තිබුණු නමුත් එහි පැවති අඩුපාඩු හේතුවෙන් එය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් රෝගීන් සඳහා විවෘතකර නොතිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු අක්මුදල රු.1,644,000,000 ක් වුවත් රු.1,956,734,245 ක් දක්වා පළාත් සභාව විසින් වියදම් දරා තිබූ බැවින් අක් මුදල රු.312,734,245 කින් ඉක්මවා තිබුණි.

(ආ) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන සැලැස්මක්, විධිමත් ක්‍රියාකාරී සැලැස්මක්, අක් මුදල් සැලැස්මක් සහ මානව සම්පත් කළමණාකරණ සැලැස්මක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.10,298,729 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධයෙන් දක්වා තිබුණු හේතු පිළිගත නොහැකි විය.

(ඇ) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2016 වර්ෂයේ ආරම්භකර තිබුණු ග්‍රාම සංවර්ධන දත්ත පද්ධතිය නිර්මාණය කිරීම 2017 නොවැම්බර් 20 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණු අතර ඒ සඳහා රු.1,488,500 ක මුදලක් වැය කර තිබුණි. එසේ වුවත් 2018 පෙබරවාරි 06 දින වන විටද එකී දත්ත පද්ධතිය ස්ථාපනය කර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයේ නැගෙනහිර නුවරගම් පළාත අධ්‍යාපන කොට්ඨාශයේ ඉතිරි වූ නිළ ඇඳුම් රෙදි පැකට් 1,971 ක් අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයට භාර දී තිබූ නමුත් 2017 ජූලි වනවිට ඉන් නිල ඇඳුම් රෙදි පැකට් 425 ක ඌණතාවයක් පැවතුනි. එසේම අනුරාධපුර අධ්‍යාපන කලාපයේ පාසල්වල සිසුන්ට 2015 වර්ෂයේ නිල ඇඳුම් නිකුත් කිරීමෙන් පසු ඉතිරි වූ රෙදි පැකට් 3903 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ඉ) කැකිරාව අධ්‍යාපන කලාපයේ පාසල් 50 කට අයත් ගොඩනැගිලි 85 ක් කඩා ඉවත් කල යුතු තත්ත්වයේ පවතින බව හඳුනා ගෙන තිබුණු නමුත් එම ගොඩනැගිලි ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය හා ඊට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) 2013 වර්ෂයේ අම්පාරේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ කටයුතු සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරියෙකුට නිකුත්කර තිබුණු රු.100,000 ක තත්කාර්ය අත්තිකාරම් මුදලින් වංචනිකව ලබාගෙන තිබුණු රු.72,000 ක මුදල, මූලික විමර්ශනයට අදාලව ඉදිරිපත් වී ඇති කරුණු සලකා බලා ඊට අදාල ක්‍රියාමාර්ගයේ මූලික පියවරක් ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එකවර ගෙවන ලෙස 2017 සැප්තැම්බර් 01 දිනැති ලිපියෙන් ප්‍රධාන ලේකම්වරයා විසින් නියෝගකර

තිබුණි.එසේ වුවත් එකී නිලධාරියා විසින් එම මුදල ගෙවා තිබුණේ 2018 සැප්තැම්බර් 03 දින දීය. එසේම එකී වංචනික නිලධාරියාට එරෙහිව වෙනත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන සුනඛ වන්ද්‍යාකරණ කටයුතු සඳහා 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පමණක් රු.157,204,050 ක මුදලක් වැයකර තිබුණි. නමුත්, සුනඛයින් සපාකෑම නිසා රෝහල් ගතවූ සංඛ්‍යාව 2015 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 23 කින් වර්ධනය වී තිබුණු අතර ජලභීතිකා රෝගය මගින් සිදුවූ මරණ සංඛ්‍යාව දෙගුණ වී තිබුණි.

(ඌ) 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුල රු.47,297,258 ක් වැය කර ඉදිකර තිබුණු මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානය 2017 අගෝස්තු 04 දින විවෘත කර තිබුණු නමුත් 2018 පෙබරවාරි 28 දින වනවිට විවෘත කල කඩකාමර 28 න් 20 ක් ම වැසී ගොස් තිබුණි.විවෘත කල කඩ කාමර 13 කට අදාලව ගිවිසුමට එළැඹීමේදී බදු කරුවන් විසින් ගෙවිය යුතු තැන්පත් මුදලින් 1/3 ක ප්‍රමාණය එනම් රු.7,381,166 ක් 2018 මාර්තු 06 දින වනවිටත් අයකර ගෙන නොතිබුණු අතර විවෘත කල කඩ කාමර 28 ට අදාලව 2018 පෙබරවාරි 06 දිනට හිඟ කුලිය රු.314,500 ක් විය.රු.8,500 කට තක්සේරු කර තිබුණු මාසික කඩ කුලිය 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 02 ක් සඳහා අදාල කර ගන්නා ලෙස ප්‍රධාන තක්සේරුකරු උපදෙස් ලබා දී තිබුණු නමුත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් කඩ කුලිය අවුරුදු 05 ට වරක් සංශෝධනය කරනු ලබන බව බදු ගිවිසුමේ දක්වා තිබුණි.

6.4 අරමුදල් ඌණ උපයෝජනය

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් වාරි මාර්ග,ඉඩම්,ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 124,106,807 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP) යටතේ ලබාදී තිබුණු රු.1,157,234,110 ක ප්‍රතිපාදන වලින් සියයට 50 කට ආසන්න මුදලක් උපයෝජනය කර නොතිබුණි.

6.5 නිශ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ගබඩාවකට 2017 මැයි 16 දින ලැබී තිබුණු ශ්‍රවණ උපකරණ අයිතමයන් 17 ක් 2018 පෙබරවාරි 22 දින වනවිටත් ගබඩාවේ පැවති අතර, 2016 වර්ෂයේ ලැබී තිබුණු ශ්‍රවණ උපකරණ ඉල්ලීම් 63 ක් වෙනුවෙන් එම උපකරණ බෙදා දී නොතිබුණි.

(ආ) උතුරු මැද පළාතේ පාසල්වල ගුරු නිවාස 1,491 ක් පැවති අතර ඉන් ගුරු නිවාස 830 ක් නිෂ්ක්‍රියව පැවතුණි. ගුරු නිවාස 1,040 ක් අළුත්වැඩියා කල යුතු තත්ත්වයේ පැවති අතර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) කාමර 09 කින් යුතු දෙමහල් ගොඩනැඟිල්ලක පවත්වා ගෙන ගොස් තිබුණු කැකිරාව ගුරු මධ්‍යස්ථානයේ පළමු මහලේ වූ කාමර 04 ක් ඵලදායී කාර්යයකට භාවිතයට නොගෙන කැඩී බිඳී ගිය උපකරණ ගබඩා කිරීමට භාවිතා කර තිබුණි. ගුරු මධ්‍යස්ථානයේ ඇති ලීටර් 500 ක සහ ලීටර් 1000 ක ප්ලාස්ටික් වතුර ටැංකි දෙකක් භාවිතයට ගත නොහැකිව පැවතුණි.

(ඈ) 2016 වර්ෂයේදී තෝරාගන්නා ලද නගර හා උපනගර වල පරිසර සංරක්ෂණ සහ අලංකරණ ව්‍යාපෘතිය යටතේ රු.1,787,819 ක් වැයකර තඹුත්තේගම බස් නැවතුම් පොළෙහි ඉදිකර තිබුණු අංග සම්පූර්ණ වැසිකිළි පද්ධතිය 2017 ජනවාරි 18 දින තලාව ප්‍රාදේශීය සභාව වෙත පවරා දී තිබුණු නමුත් එය 2018 ජූලි 31 දින වනවිටත් මහජනතාවගේ පරිහරණය සඳහා විවෘත කර නොතිබුණි.

(ඉ) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන සහ උතුරු මැද පළාත් සභාවේ ප්‍රතිපාදන මත පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිකර තිබුණු රු.මිලියන 84.5 ක් වටිනා ගොඩනැගිලි 09 ක්, රු.මිලියන 13.9 ක් වටිනා රුධිර කාන්දුකරන යන්ත්‍ර (Dialysis Machine) 05 ක්, එක්ස් කිරණ ( x-ray) යන්ත්‍රයක් සහ රු.මිලියන 1.6 ක් වටිනා ඖෂධ නිශ්කාර්යව පැවතුණි. තවද, 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.මිලියන 6.9 ක් වටිනා කාර්යාල උපකරණ හා විදුලි උපකරණ 2018 ජූලි 10 දින වනවිටත් නිශ්කාර්යව තිබුණි.

(ඊ) අරලගංවිල රෝහලෙහි වකුගඩු රෝග නිවාරණ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2016 හා 2017 වර්ෂවලදී ලබාදී තිබුණු වෛද්‍ය උපකරණ ඒකක 41 කට අදාල අයිතම 264 ක් සායන කටයුතු ආරම්භ කර නොතිබීම නිසා 2018 ජූලි වන විටත් නිශ්කාර්යව පැවතුණි.

(උ) පදවිය මූලික රෝහලේ ප්‍රධාන ක්ෂේත්‍ර 5 කට අදාල විශේෂඥ වෛද්‍යවරුන් නොමැතිවීම හේතුවෙන් වෛද්‍ය උපකරණ, සූතිකාගාර උපකරණ, ශල්‍යාගාර යන්ත්‍ර හා උපාංග මෙන්ම ශල්‍යාගාර, සූතිකාගාර ඇතුළු ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණි.

(ඌ) මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර, රු.මිලියන 59.5 ක ප්‍රතිපාදන මත 2015 වර්ෂයේ දී ඉදිකිරීම අනුමත කර තිබුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පුහුණු මධ්‍යස්ථානයේ වැඩ 2018 ජූලි 10 දින වනවිටත් අවසන්කර නොතිබුණි. එසේ වුවත් එකී පුහුණු මධ්‍යස්ථානය සඳහා 2017 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.6,907,252 ක් වූ ලී බඩු, කාර්යාල උපකරණ හා විදුලි උපකරණ නිශ්කාර්යව පැවතුණි.

(එ) උතුරු මැද පළාත් ආයුර්වේද රෝහල් සතුව පවතින නිල නිවාස 34 කින් නිවාස 31 ක්ම නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් අභාවිතව පැවතුණි.

6.6 අවිධිමත් ගනුදෙනු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම ගැනීමට නියමිතව සිටි පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පංතියේ නිලධාරිණියක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරිණියක බවට සහා ලේකම්වරයා විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තාකර තිබුණි. එසේම එකී නිලධාරිණියට හිමි වැටුප් පරිමාණයට වඩා ඉහල වැටුප් පරිමාණයක් දක්වා තිබීම හේතුවෙන් එකී නිලධාරිණියගේ මාසික විශ්‍රාම වැටුප මෙන්ම විශ්‍රාම පාරිතෝෂිකයද අධි ගණනය වී තිබුණි.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නියෝගයන්ට හා පවතින නීති රීතිවලට පටහැනිව කාර්යාල කාර්ය සහායක නිලධාරීන් දෙදෙනෙකු වෙත ප්‍රධාන සන්ධාන නිලධාරී හා නියෝජ්‍ය සන්ධාන නිලධාරී වශයෙන් තනතුරු ලබා දී 2012 අප්‍රේල් 10 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.452,256 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ආණ්ඩුකාරවරයා අනුමත කල 2001 මැයි 03 දිනැති 314/23 (1) දරන ලිපිය මත, ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5 වැනි ඡේදයට අනුකූල නොවන ලෙස පළාත් සභා අමාත්‍යාංශවල ලේකම්වරුන් ඇතුළුව පළාත් සභාවේ සියළුම ලේකම්වරුන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගෙන් මාසිකව රු.500 ක උපරිමයකට යටත්ව නිවාස කුලී අයකර තිබුණි.

6.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.

-----------------------------------------

(අ) පොළොන්නරුව දීප උයන සංවර්ධන ව්‍යාපෘතිය.

-------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පොළොන්නරුව දීප උයන සංවර්ධන ව්‍යාපෘතියට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ප්‍රධාන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතියට අදාළව එකතු පිරිවැය රු.155,405,419 ක් වූ ඇස්තමේන්තු 4 ක් විටින් විට පිළියෙල කර තිබුණි.

(ii) වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා පිළියෙල කල රු.මිලියන 15 ක් වූ පළමු ඇස්තමේන්තුව මත ඉදිකිරීම් කොන්ත්‍රාත් යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවා තෝරාගත් ලංසුකරුට ඉදිකිරීම් කටයුතු පවරා තිබුණි. එසේම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් වශයෙන් භූමි අලංකරණය (Landscaping) සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවිය යුතුව තිබුණු භූමි අලංකරණය වෙනුවෙන් පිළියෙල කර තිබුණු එකතු ඇස්තමේන්තු වටිනාකම රු. 140,642,518 ක් වූ කොන්ත්‍රාත්තු 03 ක් ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන ලෙස උක්ත කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබුණි.

(iii) G.P.S. Coordinator උපකරණය භාවිතයෙන් සහ මිනුම් පටි භාවිතා කර දීප උයන භූමියේ අතුරා තිබුණු තණ පිඩලිවල ලබාගත් මිනුම් අනුව වර්ග ප්‍රමාණය වර්ග මීටර් 8,844.11 ක් විය. එසේ වුවත් ගෙවීම් බිල්පත් අනුව තණ පිඩලි වර්ග මීටර් 10,211.01 ක් සඳහා වර්ග මීටරයකට රු.2,600 බැගින් ගෙවා තිබු බැවින් තණ පිඩලි වර්ග මීටර් 1,366.90 ක් සඳහා රු.3,553,940 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) වැලිකන්ද සිංහපුර ජල යෝජනා ක්‍රමය

-------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වැලිකන්ද සිංහපුර ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා 2013 වර්ෂයේදී ඉදිකිරීමට සැලසුම්කර තිබුණු වැලිකන්ද සිංහපුර පානීය ජල යෝජනා ක්‍රමය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර ජල ටැංකිය ඉදිකිරීමට පමණක් රු.3,443,380 ක් වූ ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එසේම මෙම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමට විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය නොකර 2014 නොවැම්බර් 17 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් ගතව තිබුණි.

(ii) 2013 වර්ෂයේ සැලසුම් කල මෙම ව්‍යාපෘතියේ ජල නල එලීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම 2016 වර්ෂයේදී සිදුකර තිබුණු අතර එය රු.6,065,680 ක ඇස්තමේන්තුවක් විය. වර්ෂා කාලයට පෙර ඉතා කඩිනමින් වැඩ අවසන් කළ යුතු බව දක්වමින් ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පළාත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ලබාගත් තීරණයක් මත එකී කොන්ත්‍රාත්තුව වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දින නිමකල යුතුව තිබුණු මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ 2017 නොවැම්බර් 22 දින වනවිටත් නිමකර නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ ලෙස දක්වමින් රු.8,421,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර එකී කොන්ත්‍රාත්තුවද දෙවන අදියර ඉටුකල කොන්ත්‍රාත්කරුට පවරා 2017 දෙසැම්බර් 28 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. 2013 වර්ෂයේ සැලසුම් කර තිබුණු මෙම ව්‍යාපෘතිය 2018 ජූනි 30 දින වනවිටද ප්‍රතිලාභීන්ගේ ප්‍රයෝජනයට ලබා දී නොතිබුණු අතර පෝෂක ප්‍රදේශයේ පවුල් 350 ක් වෙත පානීය ජලය ලබාදීම සඳහා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මෙම කාලපරිච්ඡේදය තුල රු.1,227,450 ක් වැයකර තිබුණි.

(ඇ) කන්දකාඩුව කණිෂ්ඨ විද්‍යාලයේ ගුරු නිවාස අළුත්වැඩියා කිරීම.

---------------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කන්දකාඩුව කණිෂ්ඨ විද්‍යාලයේ ගුරු නිවාස 02 ක් රු.3,999,991 ක් වූ එකතු ඇස්තමේන්තු වටිනාකමකට මත අළුත්වැඩියා කිරීම සඳහා 2016 දෙසැම්බර් 23 හා 29 දින වලදී

කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු අතර එකී කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කල බව දක්වා තිබුණු නමුත් ඒ බව සනාථ කිරීමට පැහැදිලි සාක්ෂි නොතිබුණි.

(ii) එකී කොන්ත්‍රාත්වලට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.3 (ආ) ප්‍රකාරව CIDA/SBD/03 ආකෘතියේ වූ විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(iii) 2016 දෙසැම්බර් මාසයේදී අළුත්වැඩියා කටයුතු ආරම්භ කර තිබුණු නමුත් 2018 ජූනි 30 දින වනවිටද වැඩ අවසන් කර නොතිබුණු අතර අදාල කොන්ත්‍රාත්කරු වැඩ අතහැර දමා තිබුණි. ප්‍රවාහන පහසුකම් නොමැති ඉතාමත් දුෂ්කර මෙම පාසලේ සේවය කරන ගුරුවරුන්ට අත්‍යාවශ්‍ය මෙම ගුරු නිවාස ඉදිකර දීම සඳහා වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය ප්‍රමාණවත් පරිදි යොමු වී නොතිබුණි.

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංචාරක නිවාසය අළුත්වැඩියා කිරීම

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංචාරක නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේදී රු.3,172,332 ක් වටිනාකමකට කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණු නමුත් ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (ආ) ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) 2016 අගෝස්තු 15 දින ආරම්භ කර දින 94 ක් ඇතුලත නිමකල යුතුව තිබුණු මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කිරීම 2017 මැයි 31 දින දක්වා ප්‍රමාද වී තිබුණි. එසේ වුවත් කාලය දීර්ඝ කල බවට සාක්ෂි කොන්ත්‍රාත් ගොනුවේ නොතිබුණු අතර ලංසු ලියවිලි ප්‍රකාරව ප්‍රමාද වූ දින 196 ක කාලය සඳහා රු.310,889 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මිහින්තලේ පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම.

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රු.මිලියන 05 ක වටිනාකමකට වඩා වැඩි ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් 108 දෙනෙකු උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි වී තිබුණු නමුත් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මිළ ගණන් කැඳවීමට සුපුරුදු පරිදි තෝරාගන්නා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 06 දෙනාගෙන් පමණක් ඇස්තමේන්තු වටිනාකම රු.6,155,584 ක් වූ මිහින්තලේ පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් කැඳවා තිබුණි.

(ii) තෝරාගත් කොන්ත්‍රාත්කරු සමඟ රු.6,142,175 ක වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර ඉදිකිරීම් කටයුතු 2017 අප්‍රේල් 18 දින වනවිට අවසන් කල යුතුව තිබුණි. එසේ වුවත් 2017 නොවැම්බර් 17 දින වනවිටත් එහි ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු නමුත් අමාත්‍යාංශයෙහි ප්‍රගති වාර්තා අනුව භෞතික ප්‍රගතිය සියයට 40 ක් විය.

(iii) ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් ඉටු නොකර තිබූ නමුත් 2017 මැයි 16 දින කල් ඉකුත්වීමට නියමිතව තිබුණු රු.307,109 ක කාර්ය සාධන සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට හෝ එය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ඉදිකිරීම් අතහැර දමා තිබුණු කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) හතරැස්වෙල මහා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අනිකුත් අළුත්වැඩියාවන්.

--------------------------------------------------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2. ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ විභව ලංසුකරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අවම දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවත් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ හතරැස්වෙල මහා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අනිකුත් අළුත්වැඩියාවන් වෙනුවෙන් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ලබාදී තිබුණු කාලය දින 13 ක් පමණක් විය.

(ii) 2016 ඔක්තෝබර් 12 දින රු.35,708,705 ක් වූ (වැට් රහිත) මුදලකට අදාල මෙම වැඩ කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම්ගත වීමේදී ICTAD/SBD/02 ආකෘතියේ සියළු විස්තර සහිත ගිවිසුම් ආකෘති භාවිතා කර නොතිබුණි.

(උ) පොළොන්නරුව පළුගස්දමන 2 ඇළ ප්‍රජාශාලාව ඉදිකිරීම

-----------------------------------------------------------------

පොළොන්නරුව පළුගස්දමන 2 ඇළ ප්‍රජාශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය, සීමිත මිල ගණන් කැඳවීමෙන් තෝරාගත් කොන්ත්‍රාත්කරුවකු වෙත රු.4,052,210 ක වටිනාකමට, පවරා තිබුණි. අනතුරුව පිළියෙල කර තිබුණු දෙවන ඇස්තමේන්තුවේ වටිනාකම රු.11,482,561 ක් වූ අතර ඒ සඳහා CIDA C-6 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි ලංසුකරුවන්ගෙන් ලංසු නොකැඳවා CIDA C-7 ශ්‍රේණියේ ලියාපදිංචි වී තිබුණු පළමු කොන්ත්‍රාත්කරුටම මෙම කොන්ත්‍රාත්තුව ප්‍රධාන අමාත්‍යාංශය විසින් පවරා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීමට අංක 2017/ 145 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි.

(ඌ) මැදවච්චිය ශ්‍රී සෝභිත මහ විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම

---------------------------------------------------------------------

මැදවච්චිය ශ්‍රී සෝභිත මහ විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීමට 2016 අගෝස්තු 29 දින රු.26,508,384 ක මුදලකට ගිවිසුම් ගතව තිබුණු නමුත් ඒ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.1,326,000 ක් වටිනා කාර්යය සාධන ඇපකරය ව්‍යාජ ලියවිල්ලක් බව අනාවරණය වී තිබුණි. එම හේතුව මත කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය නිමකිරීමටද කටයුතු කර නොතිබුණි.

## 6.8 අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබුණු ව්‍යාපෘති

-----------------------------------------------

ප්‍රධාන අමාත්‍යාංශයේ සහ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අඹ පැල බෙදාදීමේ ව්‍යාපෘතියකට අදාලව රු.13,263,200 ක් වටිනා අඹ පැළ 33158 ක් 2015, 2016 හා 2018 වර්ෂවලදී ප්‍රධාන අමාත්‍යාංශය විසින්ද, රු.2,550,000 වටිනා එම වර්ගයේම අඹපැළ 6,000 ක් සියයට 25 ක ප්‍රතිලාභී දායකත්වය මත 2015 හා 2016 වර්ෂවලදී පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ද මිලටගෙන බෙදා දී තිබුණි. එම පැළ වලින් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් විනාශ වී තිබුණු බව ස්ථානීය පරීක්ෂණවලදී නිරීක්ෂණය වී තිබුණි.

## 6.9 නිම නොකළ ව්‍යාපෘති

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශ්‍රම අභිමානී නිවාස ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17 ක ඉදිකිරීමට යෝජිත නිවාස 55ක් අතුරින් නිවාස 07 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිකර නොතිබුණි.

(ආ) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාමීය මාර්ගවල බෝක්කු ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක බෝක්කු 37 ක් ඉදිකිරීම සඳහා වෙන් කර තිබුණු රු.1,500,000 ක ප්‍රතිපාදනයෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.1,240,000 ක් වැයකර බෝක්කු 31 ක් පමණක් ඉදිකර තිබුණි.

(ඇ) දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP) යටතේ 2013 වර්ෂයේදී ලබාදී තිබු රු. මිලියන 566 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 269 ක් වු ව්‍යාපෘති 47 ක් 2018 ජුනි 30 දින වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළ ඉදිකිරීම් නිමකර තඹුත්තේගම රෝහල වෙත භාරදීමට නියමිතව තිබුණු ගිවිසුම්ගත වටිනාකම රු.56,056,567 ක් වූ වෛද්‍ය නිලනිවාස 02 ක් සහ ජල ටැංකියක් 2018 ජනවාරි 08 දින වනවිටත් නිමකර රෝහල වෙත භාරදී නොතිබුණි.

6.10 ආරම්භ නොකළ ව්‍යාපෘති

-----------------------------

පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 18 ක් වෙනුවෙන් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව වෙත රු.1,716,326 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එකී ව්‍යාපෘති ආරම්භකර නොතිබුණි.

6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

2017 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

6.11.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන කාර්ය මණ්ඩලය

---------------------------------------------------------------------------------

| | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ | 485 | 312 | 173 | - |
| (ii) | තෘතීයික | 192 | 110 | 84 | 02 |
| (iii) | ද්විතීයික | 2,363 | 1,524 | 839 | - |
| (iv) | ප්‍රාථමික | 1,437 | 1,260 | 200 | 23 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික) | 12 | - | 12 | - |
| | | 4,489 | 3,206 | 1,308 | 25 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු ආයතනවල දීර්ඝ කාලයක සිට පැවති ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 173 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 84 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 839 ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 200 ක් ඇතුළු තනතුරු 1,308 ක පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා නිලධාරීන් උසස් කිරීම 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සිදුකර නොතිබුණි.

6.11.2 පාසල් කාර්ය මණ්ඩලය

--------------------------------

| | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පති | 1,087 | 815 | 272 | - |
| (ii) | ගුරුභවතුන් | 16,830 | 16,580 | 250 | - |
| (iii) | සැලසුම් හා මූල්‍ය සහකාර/ සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර/ විද්‍යාගාර සහායක/ නේවාසිකාගාර පාලක | 935 | 103 | 842 | 10 |
| (iv) | පාසල් කාර්ය සහායක/පාසල් මුරකරු/අරක්කැමි/පාසල් කම්කරු | 1,318 | 1,484 | 01 | 167 |
| (v) | වෙනත් | - | 11 | - | 11 |
| | | 20,170 | 18,993 | 1,365 | 188 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමත ගුරුභවතුන් සංඛ්‍යාව 16,830 ක් වූ නමුත් තථ්‍ය සංඛ්‍යාව 16,580 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 250 ක් විය. එසේ වුවත් තථ්‍ය ගුරු භවතුන් සංඛ්‍යාවෙන් 322 දෙනෙකු ගුරු උපදේශකවරුන් ලෙසද, 287 දෙනෙකු වැඩ බලන විදුහල්පතිවරුන් ලෙසද, 50 දෙනෙකු අධ්‍යාපන නොවන වෙනත් ක්ෂේත්‍ර වෙතද අනුයුක්ත කර තිබීම හේතුවෙන් ගුරු භවතුන්ගේ තත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 909 ක් විය.

(ආ) පළාතේ අධ්‍යාපන කලාප 06 කට අයත් ගුරුභවතුන් 15 දෙනෙකු හමුදා සේවය හා විවිධ අමාත්‍යාංශ ඇතුළු වෙනත් ආයතන වෙත අනුයුක්ත කර තිබුණි. පළාත් සභාව විසින් එකී ගුරුභවතුන් වෙත 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල වැටුප් වශයෙන් රු.14,946,015 ක මුදලක් ගෙවා තිබුණු අතර ඉන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණු මුදල රු.12,516,699 ක් විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන කලාප 06 ක ගුරු පුරප්පාඩු 469 ක් වූ අතර අධ්‍යාපන කලාප 02 ක ගුරු අතිරික්තතා 219 ක් විය. මෙම තත්ත්වය නිවැරදි කිරීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 250 දක්වා අඩුකර ගත හැකි නමුත් අධ්‍යාපන බලධාරීන් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දින වනවිට පළාත් පාසල් සඳහා අනුමත විදුහල්පතිවරු සංඛ්‍යාව 1,087 ක් වුවත්, තථ්‍ය විදුහල්පතිවරු සංඛ්‍යාව 815 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 272 ක් විය. ඉන් අනුරාධපුර හා පොලොන්නරුව කලාප දෙකෙහි තනතුරු 23 ක අතිරික්තයක් පැවති අතර ඉතිරි කලාප 06 හි 295 ක පුරප්පාඩු පැවතුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දින වනවිට වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස අනුයුක්ත කර තිබුණු ගුරුභවතුන් 287 දෙනාගෙන් 164 දෙනෙකුම කැබිතිගොල්ලෑව, කැකිරාව හා ගලෙන්බිඳුණුවැව කලාපයන්හි ගුරුභවතුන් විය.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට පාසල් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 843 ක් පැවති අතර අතිරික්තතා 177 ක් පැවතුණි. අතිරික්තතා අතර පාසල් කාර්ය සහායක 156 ක් ,මුරකරු 11 ක් හා විද්‍යාගාර සහායක 10 ක් පැවතුණි.

(උ) 2017 දෙසැම්බර් 31 දිනට කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 83 හා අතිරික්තතා 04 ක් පවතුණි. අනුමත සම්පූර්ණ කළමනාකරණ සහකාර තනතුරු 60 ම පුරප්පාඩුව පැවති නමුත් කිසිඳු නිලධාරියෙකු බඳවා ගෙන නොතිබීම නිසා මෙම තත්ත්වය කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවල කාර්ය සාධනය අඩාලවීම සඳහා ඍජුවම බලපා තිබුණි.

(ඌ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුවරුන් 50 දෙනෙකු මාස 01 සිට අවුරුදු 25 දක්වා කාලයක් දෙපාර්තමේන්තුවේ අරමුණුවලට අදාල සක්‍රිය ඉගැන්වීම් ක්‍රියාවලියෙන් ඉවත්කර වෙනත් ආයතන වෙත මුදා හැර තිබුණු අතර මුදාහැර තිබුණු ගුරුවරුන් 45 දෙනෙකු වෙත ගෙවා තිබුණු වැටුප් හා දීමනාවල එකතුව රු.132,092,401 ක් විය.

(එ) 2004 දෙසැම්බර් 01 දින සිට 2014 ජනවාරි 02 දින දක්වා වෙනත් ආයතනයක රාජකාරි සඳහා මුදා හැර තිබුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උප ගුරුවරයෙකු එම කාල සීමාව සඳහා වැටුප් වර්ධක උපයා ගැනීමට සම්පූර්ණ කලයුතු කරුණු සපුරා නොතිබියදී සියළු වැටුප් වර්ධක සමඟ රු.2,415,691 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. එමෙන්ම උසස්වීම් ලබා දීමේදී සම්පූර්ණ කලයුතු කිසිදු නිර්නායකයක් සපුරා නොතිබියදී මෙම නිලධාරියා 2014 ජූලි 01 දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 පන්තියට උසස් කර තිබුණි.

6.11.3 රෝහල් කාර්ය මණ්ඩලය

--------------------------------

| | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i) | විශේෂඥ වෛද්‍ය නිලධාරි | 21 | 21 | - | - |
| (ii) | අනෙකුත් වෛද්‍ය නිලධාරි | 397 | 464 | 01 | 68 |
| (iii) | ලියාපදිංචි වෛද්‍ය නිලධාරි | 44 | 34 | 10 | - |
| (iv) | පරිපූරක වෛද්‍ය නිලධාරි | 1,100 | 787 | 313 | - |
| (v) | හෙද නිලධාරි | 621 | 632 | 22 | 33 |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vi) | තාක්ෂණ නිලධාරි (ඖෂධ සංයෝජක, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි) | 230 | 165 | 69 | 04 |
| (vii) | සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) | 394 | 696 | - | 302 |
| (viii) | සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) | 363 | 162 | 201 | - |
| (ix) | උපස්ථායක ඇතුළු අනෙකුත් සේවකයින් | 687 | 575 | 112 | - |
| | | ------ | ------ | ----- | ----- |
| | එකතුව | 3,857 | 3,536 | 728 | 407 |
| | | ==== | ==== | === | === |

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂය අවසානයට අනුමත 394 ක් වූ සෞඛ්‍ය කාර්ය සහායකයින් (කණිෂ්ඨ) සංඛ්‍යාව ඉක්මවා 302 ක් බඳවාගෙන තිබුණි. එසේ වුවත් එකී සේවකයින් පාලන අංශයේ කටයුතු ඇතුළු විවිධ කාර්යයන්වල යෙදවීම හේතුවෙන් සෞඛ්‍ය කාර්ය සහායකයින් (කණිෂ්ඨ) ගේ රාජකාරී බාහිර ඇමදුම් සේවා ආයතන වෙතින් ඉටුකරවා ගෙන තිබුණි. ඒ අනුව ඇමදුම් සේවා ආයතන 02 ක සේවකයින් 138 දෙනෙකු වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව රු.144,552,476 ක මුදලක් ගෙවා තිබුණි.

6.12 බැංකු ගිණුම්

---------------

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් 09 කට අදාලව වටිනාකම රු.3,501,114 ක් වූ හඳුනා නොගත් ලැබීම් 92 ක් හා බැංකු ගිණුම් 02 කට අදාලව වටිනාකම රු.2,139,222 ක් වූ හඳුනා නොගත් ගෙවීම් 02 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

7.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන 34 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

7.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන 35 න් 34 ක් 2017 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

7.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

2016 සහ ඉකුත් වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

7.4 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

---------------------------------------------------

7.4.1 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ දක්වා තිබුණු ඡේද වලින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු ඡේද පහත දැක්වේ.

(අ) පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 03 කට අදාළව නොපියවා තිබුණු රු.26,788,954 ක අග්‍රිම ශේෂයන් වර්ෂ 05 ට අධික කාලයක සිට පැවත එමින් තිබීම.

(ආ) පළාත් සභාවේ අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් සහ ආණ්ඩුකාරවරයා ඇතුළු 34 දෙනෙකු සඳහා ක්‍රියාත්මක හදිසි අනතුරු හා සෞඛ්‍ය යන පුද්ගලික රක්ෂණ යෝජනා ක්‍රමයකට අදාල ප්‍රතිලාභීන්ගෙන් කිසිදු මුදලක් අයනොකර පළාත් සභා අරමුදලින් 2013-2015 දක්වා කාලයට අදාලව රු.6,073,748 ක් හා 2016 වර්ෂය වෙනුවෙන් රු.3,300,196 ක් ගෙවා තිබීම.

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් 2016 ජනවාරි සිට ජූලි 21 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුල පුවත්පත්වල දැන්වීම් පළකිරීම සඳහා නියෝජිත ආයතනයක සේවය ලබා ගෙන රු.1,196,244 ක් වැඩිපුර ගෙවා තිබීම.

(ඈ) ගම් කිකිළි පැටවුන් 25,000 ක් මිලට ගැනීමට අවම මිල ගණන් සහිතව ඉදිරිපත් කළ ලංසුව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිරවුල් හා විධිමත් නිර්දේශයක් ලබා නොදීම මත පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එකී ලංසුව ප්‍රතික්ෂේපකර එකී මිලට වඩා කිකිළි පැටවකුගේ මිල රු.80 කින් වැඩි මිල ඉදිරිපත්කර තිබුණු සැපයුම්කරු වෙත අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් රු.2,000,000 ක පාඩුවක් සිදු වී තිබීම.

7.4.2 2010 වර්ෂයේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගංවතුරෙන් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී අධි ඇස්තමේන්තු කර තිබුණු රු.මිලියන 1,170 ක මුදල කපා හරින ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් කරන ලද නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

7.5 තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස එම අරමුණ කරා ගමන් කිරීමේදී සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන් පළාත් සභාව විසින් හඳුනා ගෙන නොතිබුණි.

08. පද්ධති හා පාලන

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් වෙත වාර්තා කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

| | පද්ධතිය | පද්ධතියේ අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | විධිමත් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම සහ නිසි අධීක්ෂණයක් නොවීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් | ඇතැම් ස්ථාවර වත්කම් ලේඛනගත කර නොතිබීම |
| (ඈ) | අරමුදල් උපයෝජනය | අරමුදල් ප්‍රශස්ථව උපයෝජනය කර නොතිබීම |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | i. බඳවා ගැනීමේ පරිපාටි අවිධිමත් වීම.<br>ii. සේවක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම |
| (ඊ) | ව්‍යාපෘති කළමනාකරණය ක්‍රියාත්මක කිරීම | සැලසුම්කල ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබීම |
| (උ) | ගබඩා පාලනය | තොග පොත් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබීම |